# රාගිනී

**ඔහු නැවතත් විශාබා දෙස බැලුවේය. තරුණයෙක් ඇය අසලම තල්ලුවක් ආවේය. තරුණයා විශාබාගේ උරහිසෙන් අල්වා ඇයට වැටෙන්නට ඉඩ නොදුන්නේය. ඇය ඔහු හා සිනාසීය. මේ සෙනග කන්දරාවේ හැටියට කොහේ වැටෙන්නද? මූ ඕනවට වැඩියි. තරුණයා ඇගේ ඇඟටම හේත්තුවී ඇත. ඔහුගේ එක් අතක් ඇගේ බාහුවෙන් අල්වාගෙන සිටී. එතකොට මුගේ අනිත් අත කෝ?**



පියරත්න බසයෙන් බැස ගත්තේය.
කොන්දොස්තර කොළුවා හිස නමා කල ආචාරය ඔහුගේ සිතට සියුම් ආඩම්බරයක් ගෙන දුන්නේය.
ඔහු ගෞරවය පුදකලේ තමාටද නැතිනම් නිලැඳුමටද යන්න පියරත්නට වැදගත් වූයේ නැත.
බසය සැර දමා නැවතත් පිටත්විනි.
කළුදුම ඝන වැහි වලාවක් ලෙසින් පියරත්න හා නිළැඳුම වසා ගත්තේය.
ඔහුගේ දෑස් රතු වුනි.
පෙනහැල්ලේ රැඳුනු දුම එලියට එන තෙක් කැස්සේය.
කේන්තියෙන් කාරා බසය යන දෙසට කෙල පහරක් එල්ල කලේය.
වෙන එකෙකුට කියලා හරි මූට දඩයක් දෙන්න ඕන.
ඔහු මහ පාරේ මදක් පැමිණ ඉන් නියරට ගොඩ වූවේය.
ආදරනීය පසුබෑමක්.
විශාබා සහ පිරිස ඉදිරියට පැමිණෙමින් සිටියෝය.
පියරත්නගේ දෙනෙත් පුලිඟු දෙකක් මෙන් දිලිසුනේය.
පෙරහැර බලන්නද?
ඔව්..
විශාබාවන් සූසැටහරනින් සැරසී ඉන් නියරේ සිට ඔහු දෙස බලා සිටී.
මාත් එන්නද.......
ඉල්ලීමක්...
හා..
ආරක්ෂාවටද නැත්නම්.......
එකියකගේ කට කැඩිච්ච කථාවක්. ඒ සමගම කෙල්ලන්ගේ සිරික්කිය.
සිනහා ශබ්දයට දිය කාවෙකුගේ මරනීය දිවීමක්.
දිය කාවාටත් සිනහා වරුසාවක්.
එක අතකට ඒ කථාව කිව්ව එකත් හොඳයි.
පියරත්නගේ සුසුම් හඬ අනුව පැද්දෙන නිතඹ.
කොයි හරියෙද ඉන්නේ?
හොඳ වෙලාවට අහන්න මතක් වුනේ.
ගුණසේන එක කිට්ටුව..
විශාබා හැරී බලන්නට ඉඩ ඇත.
විරාමයක්.
අනිත් උන් හන්දා කොහේ බලන්නද?
හැතිකරේ...
පියරත්න නිල්වන් ගොයමට රැව්වේය. සිනාසුනේය.
අවසානයේ මෘදු අතගෑමක්.
පියරත්න නිවසට ගියා නොව දිව්වේය.
මුව දෙවීම්, අළුත් ඇඳුම්, තව ලගන්නා සුළු සුවඳක්...
ඔහුට රූපවාහිනි වෙලඳ දැන්වීමක් සිහියට ආවේය.
අයියේ තේ එක.
දැන් එපා.
නැගනියට ගැටළුවකි....
දැන් තේ බිව්වොත් දාඩිය දානවා.
දෙසවන් අගුලු වැටුනු මවට පියරත්න පහත්වී වැන්දේය.
තමා යන බව ගිරිය පුප්පා කීමට වඩා මෙය ලෙහෙසි කටයුත්තකි.
යටිනුවර වීදිය එකම හිස්ගොඩක්
අන්තිම රන්දෝලිය
ගුණසේන සාප්පුවට ආසන්නයේ සිටම ඔහු විශාබාවන්ගේ හිස සෙවීය.
සෙනග මධ්‍යයේ විශාබාගේ රුව මතුවී ආයේය.
නෑ ඒ වෙන එකියක්.
අන්න පියුමී.
ගමේ කෙල්ලක් දෙස පියරත්න මොහොතක් බලා සිටියේය.
පියුම් කවුද දන්නේ නෑ නම දැම්මේ.
ඔහුගේ මුවග සිනා රැල්ලක සටහනක්.
මේ ඉන්නේ කිරි කෑල්ල.
පියරත්නගේ සිත පිරී යයි.
විශාබාගේ මුහුන රත් පැහැයෙන් බබලයි.
කෙල්ල තෙහෙට්ටුවටම රතුවෙලා.
පුදුම සෙනගක්නේ
සාරවිටේ...
ඝෝෂා කරන සාරවිටකාරයා දෙස පියරත්න හැරී බැලුවේය.
සාරවිට වෙළඳාම ඈතට ඇදී ගියේය.
ඔහු දෑස් වේගයෙන් මෙහෙයවීය.
මහලු කාන්තාවක් හිඳ සිටි තැනින් නැගී සිටියාය.
පියරත්නගේ දර්ශන පථය අවුල් වී ඇත.
මේ ගෑනිත් හරියටම වෙලාව බලලනේ නැගිට්ටේ.
ෂික්, විතරක්
කාන්තාව නැවතත් හිඳගනී.
ඇති යාන්තම්
තරුණයාත් විශාබාත් අතර ඇතිවී තිබූ ආලිංගනය තවමත් මිදී නැත.
ඔහු තව තවත් තම ග්‍රහනය වැඩි කරණු ඇතයි පියරත්නට සිතුණි.
ඔහු එක් පයක් පෙරට තැබුවේය.
කොහෙද ඕයි යන්නේ පොට්ටයා වගේ?
ප්‍රශ්නයක් පැන නැග්ගේය.
පය නැවතත් තිබූ තැනය.
පියරත්න මිනිසාට දවා හළු කරනා තරමේ බැල්මකින් සංග්‍රහ කලේය.
මිනිසා නිරුත්තර විය.
ඇඳ උඩ උනා දමා ආ නිල ඇඳුම පියරත්න ගෞරවයෙන් සිහිපත් කලේය.
මහලු කත නැවතත් නැගිට වටේටම නිරීක්ෂනයක යෙදී සිටී
පියරත්න හිස ඉහල පහල වමට දකුනට ගෙන යමින් තරුණයා දෙස බලන්ට විය.
යකෝ වයසට ගියහම ගෙදර ඉන්නේ නැතිව පෙරහැර බලන්න එනවා. මල වදේ.
ඔහු කේන්තියෙන් කෑරුවේය. එහෙත් කෙල ගැහීමට තැනක් නැත. ඔහු දෑස් වසාගෙන කෙල තලිය ආපසු ගිල්ලේය.
පියරත්න මහත් ආයාසයෙන් විශාබා දෙසට යන්නට පටන් ගත්තේය.
තමන් වෙතට ලන්වෙන පියරත්නව විශාබා හදිසියේම දුටුවාය.
ඈ තැති ගත්තාය.
මොහොතක් පියරත්න දෙස බලා සිට සිනාසී වේගයෙන් හැරී පසුපස සිටි තරුණයා දෙසද බැලීය.
තරුණයා ඇගේ මුහුණෝ සටහන කියෙව්වේය.
සෙනගේ අඩුවක් නැති වූවද ඔව්හු ආලිංගනයෙන් මිදුනාහ.
තරුණයාට පෙන්වූ විශාබාවන්ගේ මුහුණෝ කුමක් සටහන් වී තිබෙන්න ඇත්දැයි පියරත්න කල්පණා කලේය.
කෝපය, කලකිරීම, බිය, කණස්සල්ල, මෙයින් කුමක් විය හැකිද?
අවසර කල් රහස් තැන - ගැහැනු කව්රුද වරදේ නොබැඳෙන?
කරන්නාගොඩ සර් ගේ උපහැරනය සමග සිනාව
මොන පිස්සුද අරූ ජැක් ගහන්න හැදුවට විශාබා හිටියේ කේන්තියෙන්.
විශාබාගේ ලේ පිරී රත්පැහැ ගැන්වුනු මුහුනේ ඇති හැඟීම් පියරත්න කියවන්නට හැදුවේය.
කෝපය...
පියරත්නගේ අත සුපුරුදු පරිදි තරුණයාගේ කමිස කරේ රැඳින.
අරන් ගිහිල්ලා -- --- එල්ලලා ගහනවා පරයට.
පොලීසියට ආවේනික බැනුම් වරුසාවකින් තරුණයා නැහැවී ගියේය.
තරුණයා බිම බලා ගත්තේය.
විශාබා වෙනත් තැනකට සීරුමාරු වූවාය.
නැන්දනිය පියරත්නගේ ගුණ කදම්භය දිග ඇරියාය.
පියරත්න මහත් අභිමානයෙන් පසුබිම් කථනයට සවන් දුන්නේය.
ඔහු ඈ දෙස බලන විටදී දෑස් එකට ගැටුනහ.
ඕ ගස්සා අහක බැලුවාය.
ගැහැනු කොහොමත් එහෙමය.
සිරිපාල රාලහාමිගේ ස්ත්‍රී හඳුනාගැනීම නිවැරිදි බව පියරත්නට පසක් විය.
කොහොමටත් සෙනග ඉස්සරහා හැසිරිනු විදිය හරි මදී
චිකේ......
විශාබා පියරත්නට නොදැනෙන්න තරුණයා දෙස බැලුවාය.
මරන තුනක් ඇති මිනිහෙක් පැණි කෑය.
තරුණයා ඇස් දෙකෙන් ඈ හා සිනාසුනේය.
පියරත්නගේ හිස පසුපසට හැරෙන්නට පෙර තරුණයා බිම බලා ගත්තේය.
කොහෙද යන සෙවලයෙක්.
වඩිග පටුනට කවුරුත් කැමතිය.
විශාබා සිනාමුසු මුහුනින් වඩිග පටුන නරඹන විලාශය සිත් වශීකරන සුළුය.
ඒ දෙස තරුණයාත් පියරත්නත් මොහොතක් ආශාවෙන් බලා සිටියහ.
හොඳම වෙලාව...
පියරත්නට පමනි.
ඔහු සෙමින් සෙමින් ඇය ලඟට සේන්දු වූවේය.
ඈටත් නොදැනෙන්න ඇගේ අතක් සියුම්ව අල්ලා ගත්තේය.
විශාබා පුදුමයෙන් පියරත්න දෙස හැරී බැලුවාය.
පියරත්නගේ දෑස පන්දම් එලියෙන් දිලිසෙන අන්දම විශාබා මොහොතක් බලා සිටියාය.
ඇගේ සියුමැලි අතැඟලි රිද්මයකට මිරිකෙන්නට විය.
ඈට සිනා ගියේය.
පියරත්න ඇගේ අතැඟලි සෙමෙන් අත්හැරියේය.
විශාබාගේ මුහුණ වෙනස්වන සැටි පන්දම් එලියෙන් පියරත්නද දුටුවේය.
ඔහු නැවතත් විශාබාගේ අත අල්වා ගත්තේය.
ඔහුගේ අනෙක් අත ඇගේ ඉඟටිය සෙමෙන් වෙලා ගත්තේය.
ඕ සෙමෙන් සෙමෙන් පියරත්න ඉදිරි පිටට වූවාය.
ඔහුගේ අත් දෙක ඇය දෙපසින් ගෙන ලය මත තබා දිගු හුස්මක් ගත්තාය.
ක්‍රම ක්‍රමයෙන් ඇගේ හිස පිටුපසට බරවී අවසානයේ පියරත්නගේ උර කුහරයේ ලැගුම් ගත්තේය.
පෙරහැරේ රිද්මය වැඩිවෙන්න වැඩිවෙන්න පියරත්නගේ ග්‍රහනයද වැඩිවීම ඈ ඉවසුවේ සතුටු සිතිනි.
පියරත්න යමක් මතක් වී පසුපස හැරී බැලුවේය.
තරුණයා තමුන් දෙදෙනා දෙස බලා සිටිනවා පියරත්න දුටුවේය.
පියරත්න ඔහු දෙස බලා ඇසක් ඉඟි කොට සිනාසුනේය.
පියරත්නගේ මුහුණෝ ස්තූතිවන්ත භාවයක් රැඳී ඇතයි තරුණයාට සිතුණි.
ඔහුද පෙරලා පියරත්න හා සිනාසී පෙරහැර වෙත දෑස් යොමු කලේය.
වඩිග පටුන අවසන්වී බොහෝ වෙලාවකට පසු විශාබා නැවතත් පෙරහැර දෙසට නෙත් යොමු කලාය.

හේමලාල් විද්‍යාරත්න
lalvidya@yahoo.com